# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**

**2025 ජුනි / ජූලි**

**මානවශාස්ත්‍ර පීඨය**

## සිංහල

**(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)**

**චිරන්තන සිංහල පද්‍ය කාව්‍ය හා විචාර කලාව SINH – E3015**

පළමු කොටසේ පළමු ප්‍රශ්නයත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## 1 කොටස

01. පහත දැක්වෙන පද්‍ය උද්ධෘතවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

අ. ස්වස්ති

(මළ වි ද ඔයු) න් රත් අතින් ගත් බ (ව) මල්දම්
ඇ (ති වෙ) ය් දු ලයු තොප් ගල් කළ තද් ළ ඇත්තෙන් මුත්

ලම්බු කැරැ (එ) පස තබය අතහි අත ළඟ කොට
ගත අතහි මලකඩෙ එක බල (සි) ටි රනවන කුළැහි

ඔජලු ගී
ගැහැනී ලියක් බෙයන්ද්හි රන්වනුන් අ (ත) රෙ
මන ම තමනට් මෙ ගත් හත්හි මල්දම් අතින් (මැ) ඩැලැ

ආ. සුරතුපුල සරණින් වටොරනෙන් සුවන් රඹ
ගන නිල් වසානි බමර වැළ තෙපලෙන් කොවුල්සර

ලවනින් බිඹුවැළන් දසනගිනි සැදි ඉඳුවර
තුනු තුනු හව්වෙන් මඳනලනු ළෙළ ලිය විලස්

වුවනින් පුල් පියුම් මඳ සුසුමෙන් නල සුවඳ
සවනතනෙන් ලිය ඊල් නළලතිනි මුවරඳ පට

ඇ. යසින් නොකිලිටියෝ
ලොව කප්තුරු සෙ සිටියෝ
වාද ඇසියටියෝ
උන්නු සිටුතනතුරු පිහිටියෝ

තියුණු නුවණැත්තෝ
රට රකිනා කැමැත්තෝ
කුලුණෙන් ළතෙත්තෝ
උන්නු උන් වෙත රජ ඇමැත්තෝ

සමර- සම සුරුවෝ
අවිසිප් සරම දැරුවෝ
නැණබරණ දැරුවෝ
පසෙක උන්නුය රජ කුමරුවෝ

ඇ. මනරම් සිරි පැරකුම් නර වරණේ
ඉවැසුම් ගුණයට සත පිය කරණේ
පව්කම්කළ සතහට වන උරණේ
යළිකුම් සරිවෙද පුවතර දෙරණේ

මුනිගුණ සැලකුම් සිතැපා නොවැකුම්
කළ නිති නොතැකුම් විකුමෙහි තෙවිකුම්
තිළිණෙන් සුරකුම් ලකනැව සරිකුම්
අගරජ පැරකුම් දින පෑ පැරකුම්

රුඳැ වූ වෙත සරසවි කමලම්බා
මෙනිරිඳු තුම නම සිරි පැරකුම්බා
සඳහන් කළ සතහට බැති පෙම්බා
ලැබෙනුයැ ලොවැ ඇති සව්සිරි එම්බා

(ලකුණු 10 x 4=40)

## II කොටස

02. වස්තු විෂය හා භාෂාව කෙරෙහි සාවධාන වෙමින් සීගිරි කවීන්ගේ නිර්ව්‍යාජ කවිත්වය අගයන්න.

03. අනුරාධපුර හා පොලොන්නරු යුගවල පද්‍ය සාහිත්‍යය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

04. කව්සිළුමිණ සාර්ථක මහා කාව්‍යයක් බවට පත්වීමට බලපෑ හේතු සනිදර්ශන ව විභාග කරන්න.

05. චරිත හා සිද්ධි නිරූපණය කෙරෙහි විශේෂාවධානය යොමු කරමින් ගුත්තිල කාව්‍ය කෘතියේ සාර්ථකත්වය අගයන්න.

06. පැරකුම්බා සිරිත විශිෂ්ට කාව්‍ය කෘතියක් බවට පත්වීමෙහි ලා ශබ්දාර්ථ සුසංයෝගය බලපා ඇති ආකාරය නිදසුන් දෙමින් පරීක්ෂා කරන්න.

## III කොටස

07. භාරතීය කාව්‍ය විචාරයේ සම්භවය මගින් පෙරදිග කාව්‍ය විචාර ක්ෂේත්‍රය මත පතිත වූ ප්‍රභාව පැහැදිලි කරන්න.

08. "විභාවානුභාව ව්‍යභිචාරි සංයෝගාද් රස නිෂ්පත්ති: " යන්න ආශ්‍රයෙන් රස සංකල්පය පිළිබඳ ඔබේ නිරීක්ෂණ ඉදිරිපත් කරන්න.

09. "කෙටි පද්‍ය රචනා විචාරයට ලක්කිරීමේ දී වඩාත් වැදගත් වන්නේ ප්‍රායෝගික විචාරයයි." විභාග කරන්න.

10. කාන්තාවාදී විචාරය යනු කුමක්දැයි පැහැදිලි කොට, විචාර සිද්ධාන්තයක් වශයෙන් එහි පවතින වැදගත්කම විග්‍රහ කරන්න.

(02 සිට 10 තෙක් සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගිනි.)

******************************